# තැපැල් ඡන්දය සම්පූර්ණයෙන්ම සෞඛ්‍ය නිර්දේශ යටතේ

## - පැෆරල් කියයි

රනිල් ධර්මසේන

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තැපැල් ඡන්ද විමසීම ආරම්භ වූ ඉකුත් 13 වැනිදා සිට ඊයේ (15 දා) දක්වා වූ දින තුනෙහි සම්පූර්ණයෙන්ම සෞඛ්‍ය නිර්දේශ යටතේ පැවති බවට නිරීක්ෂණය වූ බව පැෆරල් සංවිධානය පවසයි.

මෙවර තැපැල් ඡන්ද සළකුණු කිරීම ඉතා හොඳ මට්ටමක පැවති බවද ඡන්ද මධ්‍යස්ථානවල පක්ෂ නියෝජිත සහභාගීත්වය ද ඉහළ මට්ටමක පැවති බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (15 දා) පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

තැපැල් ඡන්ද මධ්‍යස්ථානවල පක්ෂ නියෝජිතයන්ගේ සහභාගීත්වය අනුව පොදුජන පෙරමුණේ නියෝජිතයන් සියයට 51 ක් පමණ ද සමගි ජනබලවේගයේ සියයට 31 ක් ද, ජාතික සමගි පෙරමුණේ සියයට 20 ක් පමණ ද එජාපයේ සියයට 19 ක් පමණ ද සහභාගී වී ඇති බවට නිරීක්ෂණය වූ බවද හෙතෙම කීය.

මැතිවරණ කොමිසම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පොලිසිය, ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක නිලධාරීන් අද (16 දා) හා හෙට (17 දා) තැපැල් ඡන්ද සළකුණු කිරීමට නියමිතය. එමෙන්ම ඉහත කිසිදු දිනක තැපැල් ඡන්ද සළකුණු කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ලබන 20 හා 21 තැපැල් ඡන්ද සළකුණු කළ හැකි වේ.